06

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2018, Vol. 7 (II) 67-82pp
© The Author 2018
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ ඉතිහාසය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඩබ්.එම්. චින්තක සඳරුවන්*[1]

## Abstract

Heritage can be principally divided into two major divisions; Cultural Heritage and Natural Heritage. The concept of Cultural Heritage consists of monuments, buildings and fields. The concept of Heritage Management has been initiated after 1950s. Though Heritage Management isn't conceptual, the use of different methods in Sri Lankan Cultural Management can be identified. It draws attention to the studies or the facts in Buddhist Philosophy, such as eras, kings, female monarch, rulers of Village and their interference in colonization moreover, intervention in department of Archaeology and related cultural centers and finally international interference. It is surmised that, when identifying the structure of Heritage Management, basically it is based on Buddha's sermons. It is because, Sri Lankan Cultural has been influenced by Buddhism. On the basis of the findings, constructions of Buddhist monastery after 3rd Century has been influenced by Buddhist preaching. Afterwards, because of Foreign Invasion, Rajarata civilization has been abandoned and again undergone reobservations in colonization period. Thus, 1890 can be considered as a productive

[1]සහය කථිකාචාර්ය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, මිහින්තලේ, 071-4199931, Chinthakasandaruwan13@gmail.com

period and fruitful period of time according to the findings of department of archaeology. In 1940, there was a legal background towards Sri Lankan Archaeological Heritage. This paper identifies, the establishment of heritage management institutions, projects and proposals that correspond well to the conservation of heritage.

**Key Words:** Heritage Management, Archaeology related Laws, Ordinances,

## හැඳින්වීම

උරුමය ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා දැක්විය හැකි ය. එනම් සංස්කෘතික උරුමය හා ස්වාභාවික උරුමය ලෙයසි. සංස්කෘතික උරුමය නැමති සංකල්පය තුළට ස්මාරක, ගොඩනැගිලි සමූහ හා ක්ෂේත්‍ර යන අංගයන් අයත් වේ (UNESCO,1972:2). උරුමය සංස්කෘතික විවිධත්වය අනුව සමාජයෙන් සමාජයට, රටින් රටට වෙනස් වේ. උරුම සංකල්පය බිහි වූ මුල් යුගවල දී විශ්වීය මට්ටමෙන් උරුමය පිළිබඳ ව හඳුනාගත් අතර වර්තමානය වන විට දේශීයත්වය මත පදනම් වෙමින් උරුමයන් හඳුනාගනිමින් උරුමයන්ට විශ්වීය අගයක් එක් කරමින් ලෝක උරුම බවට පත් කර ඇත. මේ නිසා උරුමය විශ්වීය සම්පතක් ලෙස සළකා සංස්කෘතික සම්පත් කළමනාකරණය, සංස්කෘතික උරුම කළමනාකරණය සහ පුරාවිද්‍යා උරුම කළමනාකරණය වැනි යොමුවීම් ඔස්සේ වර්තමාන පැවැත්මත්, අනාගත සුරක්ෂිතතාවය සඳහාත් කටයුතු කරනු දැකගත හැකි ය. ඒ අනුව උරුමය හඳුනාගැනීම, ලේඛනගත කිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, අර්ථකතනය කිරීම හා ඉදිරිපත් කිරීම ආදී විවිධ මැදිහත්වීම් ඔස්සේ විධිමත් හා විද්‍යාත්මකව සිදු කරයි. මෙහි දී ලාංකේය උරුමයේ කළමනාකරණ ස්වරූපය හා ඉතිහාසය පිළිබඳ ව සොයා බැලීමක් සිදු කෙරේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රමුඛව පදනම් වී ඇත්තේ සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හා ශිලා ලේඛන සාධක වේ. ඒ සඳහා පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල අධ්‍යයන කටයුතු සිදු කරන ලදි.

## අරමුණු පරමාර්ථ

උරුම කළමනාකරණය පිළිබඳ සාධක හමුවන බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් පිළිබඳවත්, ඓතිහාසික අනුරාධපුර යුගයෙන් පසුව මෙරට කළමනාකරණයේ ව්‍යාප්තීය ස්වභාවය, 1980 දශකය තුළ සිදුවන වර්ධණීය තත්ත්වයන් හා වර්තමාන යුගයේ දී එහි ක්‍රියාකාරී ස්වරූපයත් මෙතුළින් අධ්‍යයනය කිරීම මුඛ්‍ය අරමුණු පරමාර්ත වේ.

## විමර්ශනය

ශ්‍රී ලංකාව සතු උරුමය පිළිබඳ ව විමසිලිමත්ව බැලීමේ දී එය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පූර්ව ඓතිහාසික යුගය, ඓතිහාසික යුගය, ප්‍රාග් නවීන සමාජය දක්වා ම විහි දී යනු දැකගත හැකි ය. මෙම යුගයන් අතර ක්‍රිස්තු පූර්ව යුගය ඉතා වැදගත් කඩඉමකි. ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවසේ මුල් භාගයේ සිට ලංකාවේ දේශපාලන බලය ලබාගත් පාලකයින්, සංඝ සමාජය සහ සාමාන්‍ය ජනතාව උරුමයේ සත්‍යතාවය ආරක්ෂා කර ගනිමින් කටයුතු කරයි. උරුම කළමනාකරණය යන සංකල්පය නොවුනත් එම කාර්යයේ නියලෙමින් උරුමයන් සඳහා මැදිහත් වූ ආකාරය පැරණි මූලාශ්‍ර හා සෙල්ලිපි තුළින් අනාවරණය වේ. දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් න්‍යායාත්මක වශයෙන් උරුම කළමනාකරණ සංකල්පයේ ආරම්භය සනිටුහන් කරනුයේ පළමු වැනි ලෝක සංග්‍රාමයෙන් පසුව මෑත කාලීන ඉතිහාසයේ සිදු වූ උරුමයන්ට හානි පැමිණ වීමත් විනාශ කිරීමත් හේතු කරගෙනය. එහෙත් මානවයා සතු වූ උරුමයන් කළමනාකරණය කර ගැනීම සඳහා භාවිතු ක්‍රියාවලීන් පිළිබඳ සාක්ෂි මෙම න්‍යායාත්මක සංකල්පයට වඩා පැරණි බව හඳුනාගත හැකි ය. ලෝක ඉතිහාසය තුළට මෙහි විශේෂ බලපෑමක් එල්ලවන්නේ 1959 දී ඊජිප්තුවේ නයිල් නදිය හරස් කර ආස්වාන් වේල්ල ඉදිකිරීමත් සමඟ අබුසිම්බල් හා ෆයිලි යන පුරාණ දේවස්ථාන ජලයෙන් යටවීමත් නිසා ඇතිවන තත්ත්වය පාලනය කිරීම සඳහා (ගුණවර්ධන, 2005: 96-97) වේ. මෙම නිසා උරුමයේ ආරක්ෂාව සඳහා දේවස්ථානය පැරණි ස්ථානයෙන් ගලවා ඉවත් කිරීමක් සිදු කරයි. මෙය 'ගලවා ගැනීමේ පුරාවිද්‍යාව' (Rescue Archaeology) ලෙස හැඳින්වූ අතර එය උරුම කළමනාකරණයේ වැදගත් අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි ය. ලංකා ඉතිහාසය තුළ 1977 වර්ෂයේ දී විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වාදීමත් සමඟ ඇති කරන ලද විශාල සංවර්ධන ව්‍යාපෘති මඟින් පුරාවිද්‍යා උරුමයට හානි වූ අවස්ථා ද හඳුනාගත හැකි ය. මහවැලි සංවර්ධන ව්‍යාපෘති මඟින් කොත්මලේ, රන්දෙණිගල ඇති බෞද්ධ ස්මාරක රාශියක් විනාශයට පත් විය. 2004 වර්ෂයේ ඇති වූ 'සුනාමි' ව්‍යසනය නිසාවෙන් ද ලංකාවේ සමුද්‍රාශිත පුරාවිද්‍යා උරුම ස්මාරක ගණනාවක් විනාශයට ලක්විය. කෙසේ වෙතත් නෛතික වශයෙන් ද ලංකාවේ උරුමය ආරක්ෂා කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගෙන ඇත. 1940 පුරාවස්තු ආඥාපණත, 1998 සංශෝධිත පුරාවස්තු ආඥාපණත මගින් හා 2006

වර්ෂයේ ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය මගින් ද මේ සඳහා මැදිහත් වීම් සිදු කර ඇත.

## ලාංකේය කළමනාකරණ ස්වරූපය හා ක්‍රියාකාරිත්වය

පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ ඉතිහාසය බෞද්ධ දර්ශනයේ එන මූලික ඉගැන්වීම් කේන්ද්‍රකර ගෙන ආභාසය ලබා ඇති බව පෙනේ (ගුණවර්ධන, 2005:14). බුදුන් වහන්සේ ජීවත්ව සිටි අවධියේ දී සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ගොඩනැගිලි තම වාසස්ථාන ලෙස පරිහරණය කිරීමට අනුදැන වදාළ අතර ඉක්බිතිව ඒවායේ ඇති විය හැකි කැඩී බිඳීයාම්, ක්ෂයවීම් ආදී ස්වාභාවික උපද්‍රව සඳහා අලුත්වැඩියා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව ගත යුතු ක්‍රියාමාර්ගයන් විස්තර කර ඇත. ඒවා මෙසේය,

1. **සුදු පැහැ, කළු පැහැය හා ගුරු පැහැ පිළියම් කිරීම.**
2. **රළු බිත්තියේ සුදු පැහැය නො රැඳෙන විට දහයියා කුඩු අත්ලෙන් තුනී කොට සුදු පැහැය සකස් කිරීම.**
3. **ගුරු පැහැය නො රැඳෙන විට කුඩු මුසු මැටි අත්ලෙන් මැද ගුරු පැහැය ගැනීම.**
4. **බිත්තියේ තැනින් තැන බිංදු වශයෙන් උස්ව නැඟී සිටියේ නම් රෙදි කඩකින් පිස දැමීම.**
5. **බිම කළු පැහැය ගැනීම සඳහා ගැඩවිලි පස්, නෙල්ලි හා මැලියම් අත්ලෙන් මැද ගෑම.**
6. **විහාර බිත්ති දිරන විට ලී විද කණු සිටුවා බිත්ති බැඳීම.**
7. **විහාර බිත්ත තෙමෙන විට එහි ආරක්ෂාව සඳහා වාසුගොම, අළු මැටි එකට මිශ්‍රකොට පැලැල්ලක් එයට සම්බන්ධ කර ගැනීම (ගුණවර්ධන, 2005:14).**

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ බෞද්ධ සංඝයා වහන්සේලා තම ආරාම නඩත්තු කළ බවත් ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම කළමනාකරණ කටයුතු පිළිබඳ ව දැනසිටි බවත් ය. අංගුත්තර නිකායට අයත් චුල්ල වග්ගයේ ද බෞද්ධ සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ඉදිකිරීම, රැකබලා ගැනීම හා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි මැදිහත් වීමට අනු දැන වදාරා ඇත.

**"අනුජානාමි භික්ඛවේ නවකම්මං දාතුං**
**නවකම්මකො භික්ඛවේ භික්ඛු උත්සුක්කං**
**ආපජ්ජිස්සති කින්ති නුකො විහාරො**
**ඛිප්පං පරියොසනං ගච්ඡෙය්‍යාති**
**ඛණ්ඩඵුල්ලං පටිසංඛරිස්සති"**(චු.ව.පා. 170)

ශ්‍රී ලංකේය ඉතිහාසය තුළ ද ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවස ඉතා වැදගත් සංධිස්ථානයක් වේ. එයට හේතුව වන්නේ අශෝක අධිරාජයාගේ අනුග්‍රහය මත මෙරටට බුදු දහම නිල වශයෙන් ලැබීමයි. මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනයත් සමඟ මෙරට පාලකයා වූ දේවානම්පිය තිස්ස (ක්‍රි.පූ. 250-210) රජු බුදු දහම පිළිගනිමින් මෙරට රාජ්‍ය ආගම බුදු දහම බවට පත් කරයි. ඒ අනුව අනුරාධපුර රාජධානියේ ඓතිහාසික යුගයේ ආරම්භය තිස්ස රජුගේ කාලසීමාව තුළ දී ආරම්භ වනු දැකගත හැකි ය (වත්තල. 1998:2). සසමිත් තෙරණියගේ පැමිණීමත් සමඟ විවිධ වෘත්තීය කුල පිළිබඳ ව වංසකතා සඳහන් කරන අතර ක්‍රමවත් ආකාරයෙන් බෞද්ධාගමික ගොඩනැඟිලි හා වෙනත් නිර්මාණ ඉදිකිරීම් ආරම්භ කිරීම මෙම යුගයේ සිට ක්‍රියාත්මක වේ. එහි පළමු ඉදිකිරීම් අවස්ථාව ලෙස මහමෙවුනා උයන පූජා කිරීම දැක්විය හැකි ය (මව.xv:24-25). මේ සමඟම අනුරධපුර කලාපය තුළ විවිධ බෞද්ධ ආරාමයන් ඉදි කරන්නට විය. එසේම ඒවා පාලනය කිරීමත් නඩත්තුවත් සිදු කරන ලදි. මහාවංසය තුළ දක්වන පරිදි මිහිදු හිමි ඇතුළු පිරිස පැමිණීමෙන් පසුව සංඝයාගේ පෝෂණ කටයුතු රජ මාළිගය මගින් සිදු වූ බව දක්වා ඇත (එම, xix:178,214). මෙම යුගයේ උරුමය කළමනාකරණය පිළිබඳ පැහැදිලි සාධකයක් මහාවංසය තුළ සඳහන් වේ. සංඝමිත්ත තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම කළ නැවෙහි පළුපත, කෙනිපානය හා තුඹහිටිය මහජන ප්‍රදර්ශනය සඳහා මෙහෙණවර තුනක් ඉදිකොට තැම්පත් කළ බව සඳහන් වේ (ම.ව. xvii:68-70). මෙය වර්තමාන උරුම කළමනාකරණ සංකල්පය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන අංගයකි. උරුමයේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත ස්ථානයන් තුළ පුරාවස්තු ලෙස සලකා භාණ්ඩ හෝ ස්මාරක තැම්පත් කිරීමත් ප්‍රදර්ශනය කිරීමත් ජාත්‍යන්තරව පිළිගත් සංකල්පයකි.

ලක්දිව ප්‍රථම ස්තූපය වශයෙන් පිළිගනු ලබන්නේ දේවානම්පිය තිස්ස (ක්‍රි.පූ. 250-210) රජු විසින් ඉදිකරන ලද ථූපාරාමයයි (එම, 71:24-65). මෙම ප්‍රථම ස්ථූපය වූ නිසාත් බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැම්පත් කර ඇති නිසා රාජ්‍ය අනුප්‍රාප්තිකයන් මෙම උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ කටයුතු සිදු කළ බව හඳුනාගත හැකි ය.

පහත වගුව පරිදි විවිධ රජ්‍ය පාලකයන් විසින් ථූපාරාමය සඳහා කළමනාකරණ කටයුතු සිදු කළා සේම අනෙකුත් විහාරාංග පාලනයටත් නඩත්තුව සඳහාත් කළමනාකරණ කටයුතු සඳහාත් අනුග්‍රහය දැක්වා ඇති බව මහාවංසය, දීපවංසය ආදී මූලාශ්‍රය මගින් ප්‍රමාධික සාධක ලැබේ. මෙයට අමතරව සමකාලීනව ලිය වී ඇති ශිලා ලේඛනයන් ද මෙහි දී වැදගත් වේ. හතර වැනි මිහිඳු (ක්‍රි.ව. 982-1029) රජුගේ මිහින්තලා පුවරු ලිපිය මෙහි දී නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙහි ආරාම නඩත්තු කටයුතු, කළමනාකරණ කටයුතු මෙන්ම සේවය සපයන පිරිස් සඳහා දිය යුතු වැටුප් ප්‍රමාණයන් පිළිබඳ ව එහි පැහැදිලි ව දක්වා ඇත.

**වගු අංක 2:1 ථූපාරාම විහාරයේ සිදු කළ කළමනාකරණ කටයුතු හා සම්බන්ධ වූ පාලකයින්**

| කාර්යය | පාලකයා |
|---|---|
| ස්තූපයේ ආරක්ෂාවට ගල් ආවරණයක් සැකසීම | ලජ්ජිතිස්ස රජු (ක්‍රි.ව. 119-109) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත්වැඩියාව | ගොඨාභය රජු (ක්‍රි.ව. 253-266) |
| ස්තූපයේ උපරිබාගයේ රනින් ඡත්‍රයක් පැළඳවීම | පළමු වැනි උපතිස්ස රජු (ක්‍රි.ව. 368-410) |
| සමස්ත ස්ථූපය ප්‍රතිසංස්කරණය | ධාතුසේන රජු (ක්‍රි.ව. 459-477) |
| ධාතු ගර්භය, ස්තූපයේ පියස්ස ඇතුළු අලුත්වැඩියා කිරීම් | පළමු වැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව. 575-608) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත් වැඩියාව | දෙවැනි කස්සප රජු (ක්‍රි.ව. 650-659) |

(ගුණවර්ධන, 2005:23), (සුරවීර, 1997:105-113).

**'... නො ගතැ යුතු මෙහෙයැ බද් මිනිසුන් කැමියන් තුමනට් මෙහෙ නො ගතැ යුතු අනොබ මෙහෙයට් නො දියැ යුතු**
**කතුමහසැයෙහි නම්නවාමට් දම්ගම්යෙන් දුන් පයල ඇත්වෙහෙර් කැමියන් බලා ගෙනැ දාගැබ්හි**
**කම්නවාම් කැරැවියැ වියැ යුතු කිර්බඞපවු දාගැබෙහි අරකට් ඇල්ගම්යෙන් දුන් දෙකිරිය දී අරක්**
**කැරැවියැ යුතු දාගෙහි ඉසා මඟුල් මහසලපිළිමගෙහි ඉසා මහබෝය්ගෙහි ඉසා නයින්දැ ඉසා මිණිනා...'**

(කරුණාරත්න, 2000:44).

මෙහි දක්වා ඇති පරිදි,

**'කැමියන් විසින් වෙහෙරෙහි මෙහෙයට අනුබද්ධ මිනිසුන් තමාගේ මෙහෙයට නොගත යුතු යි. පිට මෙහෙයටත් නොදිය යුතුයි. කතුමහසැයෙහි ප්‍රතිසංස්කරණ කටයුතුවලට දම්ගම්යෙන් දුන් ලැල ඇත්වෙහෙර කැමියන් බලාගෙන දාගැබ ප්‍රතිසංස්කරණ කටයුතු කරවිය යුතුයි. කිරිපඬුපව් දාගැබෙහි ආරක්ෂාවට අල්ගම්යෙන් දුන් දෙකිරිය දී ආරක්ෂා කරවිය යුතුයි'**

යනුයෙන් දක්වා ඇත. මෙමගින් ස්තූප නිර්මාණයෙන් අනතුරුව ප්‍රතිසංස්කරණ කටයුතු හා එහි ආරක්ෂාව උදෙසා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බව හඳුනාගත හැකි ය. මෙම ශිලා ලේඛනයේ තවදුරටත් විස්තර කරන පරිදි,

**'...ඇත් වෙහෙරින් රන් කලං සියයකුත් වී දස යාලකුත් යන මෙතුවාක් ගෙන හවුරුදු පතා මේ විහාරයෙහි දැගැබ් ආදී හැමතැන්හි ප්‍රතිසංස්කරණ කටයුතු කරවිය යුතුයි...'**(එම, 46)

නිශ්ශංකමල්ල රජුගේ දඹුළු ශිලා ලේඛනයට අනුව දඹුල් විහාරයේ ලෙන් හා පිළිම නඩත්තුව සඳහා සිදු කළ පරිත්‍යාගයක් පිළිබඳව සඳහන් වේ.

**'දඹුලු ලෙනේ ඔත්, හිඳි, සිටි පිළිම විහාරයට ......... (සහ) රන්මය කරවා (ස)ත් ලක්ෂයක් ධන වියදම් කොට මහාපූජා කරවා සුවර්ණගිරිගුහා යැයි නම් තැබ්මෙන් අනතුරුව...'** ආදී ලෙස විස්තරයක් එහි දක්වා ඇත.

ක්‍රිස්තු වර්ෂ 1017 දී අනුරාධපුරයට එල්ල වූ චෝල ආක්‍රමණ හමුවේ අනුරාධපුර රාජධානිය බිඳ වැටෙන අතර පළමු වැනි විජයබාහු රජු විසින් චෝලයන් පළවා හැර රාජ්‍යත්වයට පත්වන අතර නව අග නගරය ලෙස පොළොන්නරුව තෝරා ගනිමින් රාජ්‍ය පාලනය ගෙන යනු දැකිය හැකි ය. පළමු වැනි විජයබාහු (ක්‍රි.ව. 1055-1110), පළමු වැනි පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153-1186) හා නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව. 1187-1196) වැනි ප්‍රබල පාලකයින් පොළොන්නරු යුගය තුළ නැවත බිහි නොවීමත් සමඟ රාජ්‍ය අස්ථාවරත්වයක් හට ගන්නා අතර මෙම යුගයේ උරුම කළමනාකරණ කටයුතු පිළිබඳ ව සොය බැලීමේ දී ද එම කරුණු පිළිබඳ ව අවධානයක් යොමු කළ යුතු වේ. ඒ අනුව මෙම යුගයෙන් පසුව උරුමය සම්බන්ධයෙන් දක්වා ඇති දායකත්වය පිළිබඳ ව සංක්ෂිප්තව පහත දැක්වේ.

- මහියංගන ස්තූපය පළමු වැනි විජයබාහු රජු (ක්‍රි.ව. 1055-1110) දවස ප්‍රතිසංස්කරණය කළ බව පුරාවිද්‍යාත්මක ව සිදු කරන ලද කැණීම් මගින් අනාවරණය වීම (පරණවිතාන, 2001:78).
- රුවන්වැලිය, දෙනනාක, ථූපාරාමය ආදී ස්තූපයන් පළමු වැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1153-1186) විසින් බැන්ද වීම (පූජාවලිය. 783).
- පළමු වැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) විසින් ස්තූප 73ක් හුණු බදාමයක් මගින් ආවරණය කර ශක්තිමත් කළ බව සඳහන් වීම (මව.lxxvi:105).
- කැලණි ස්තූපය තුන් වැනි විජයබාහු රජු (ක්‍රි.ව. 1196) විසින් දෙමළුන් විසින් බිඳ දැමීමෙන් පසුව බැන්ද වූ බව සඳහන් වීම (එම, 786).
- දෙ වැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1236-1270) කැලණි ස්තූපය හුණු ගා ප්‍රකෘතිමත් කර තිබීම (එම,lxxxiii:64).
- දෙ වැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි. ව. 1236-1270) විසින් ''ශ්‍රී ලක හැම දාගොප් හැම විහර වල් බඳින්ඩ නැර අවුරුදු පතා සුනු පදනම් ලවයි''නියෝග කර ඇත (රාජාවලිය. 215).

- ➢ හතර වැනි බුවනෙකබාහු රජුගේ (ක්‍රි.ව. 1341-1351) ඇමතිවරයකු වූ සේනාලංකාධිකාර කාංචියෙහි ප්‍රතිමා ගෘහයක් අලුත්වැඩියාව සඳහා මුල්‍යමය ආයෝජන කළ බව පරණවිතාන දක්වා ඇත.

- ➢ හතර වැනි විජයබාහු රජු (ක්‍රි. ව. 1270-1272) දවස ජරාවාසව පැවති දළඳා ගෙය බිම්පිස කරවා ඇත (පූව. 800).

- ➢ හතර වැනි විජයබාහු රජු (ක්‍රි. ව. 1270-1272) විසින් පොළොන්නරුව ප්‍රකෘතිමත් කළ බව සඳහන් වේ (මව. lxxxvi:**91-102**). උරුයන් සඳහා සිදු වී පැවති හානියත් ඒ සඳහා යෙදිය යුතු පිළියම් හා පිළියම් කළ යුතු කාලය පිළිබඳ ව ද අධ්‍යයනය කරමින් එම සංරක්ෂණ හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ බව සඳහන් වේ.

දහසය වැනි සියවසෙන් පසුව බටහිර ජාතීන් මෙරටට පැමිණීමත් ලාංකේය උරුමය සම්බන්ධයෙන් සිදු වූ වෙනස්කම් ගණනාවක් දැකගල හැකි වේ. 1505-1658 දක්වා වූ පෘතුගීසි පාලන යුගයත් (අබේසිංහ, 1969:1-208), 1658-1796 දක්වා වූ ලන්දේසි පාලන යුගයත්, 1796 ලන්දේසින් සතු වූ මුහුදුබඩ ප්‍රදේශ අයත් කර ගැනීමත් (විමලරත්න, 1963:15), 1815 දී රාජාණ්ඩුව අහිමි වීමත් (විමලානන්ද, 1963:84) අතර යුගයේ දී උරුමයන් සම්බන්ධයෙන් සිදු වූ මැදිහත් වීම් මෙහි දී වඩා වැදගත්කමක් උසුලයි. මෙම කාල වකවානුව තුළ දී විදේශීය බලපෑම මත ඇතැම් දේශීය උරුමයන් විනාශ වීමක් ද ආරක්ෂා වීමක් ද හඳුනාගත හැකි අතර අස්ථාවර රාජ්‍ය පාලනයන් තුළ උරුමය රැක ගැනීම සඳහා සිදු කළ මැදිහත් වීම් ද හඳුනාගත හැකි ය.

1521 දී ඇති වූ දේශපාලනික ගැටලු හේතුවෙන් මෙරට රාජ්‍ය පාලය අනු කොටස් කිහිපයකට බිඳී යන අතර එහි දී උප රාජධානි අතර සිදු වූ ගැටුම් හේතුවෙන් කෝට්ටේ රාජධානිය අස්ථාවර වීම සිදු විය (අබේසිංහ, 1966:2-3). මෙම නිසා විදේශීය හමුදා සහයෝගය ලබා ගැනීමත් සමඟ වාස්තුවිද්‍යාත්මක උරුමයන්ට හානි සිදු වූ බව හඳුනාගත හැකි ය. පරණවිතාන දක්වන පරිදි හතර වැනි පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1302-1326) රාජධානියේ ගොඩනැගිලිවල සලකුණු පවා පෘතුගීසින්ගේ ක්‍රියාවලි හේතුවෙන් විනාශ ගිය බව දක්වා ඇත (මල්සිරි, 2011:171). නාථ දේවාලයේ නැගෙනහිර බිත්තියේ පිට පැත්තේ සිතුවමක කුරුටු ගා තිබෙන නැව් සළකුණු (ප්‍රේමතිලක, 2000:15) පෘතුගීසින් විසින් සිදු කරන්නට ඇති බව සඳහන් වේ.

කෙසේ වෙතත් මෙම කාලපරාසය තුළ දී උරුමයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය පාලකයින් විවිධ ක්‍රියාමාර්ග ගත් ආකාරය ද හඳුනාගත හැකි ය. ක්‍රිස්තු වර්ෂයෙන් 1725 දී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව. 1477-1496) විසින් , තිස්සමහාරාම විහාර සන්නස මගින් බුද්ධරක්ඛිත ගණින්වහන්සේට විහාර නඩත්තුව සඳහා සිදු කරන ලද පරිත්‍යාගයක් පිළිබඳ ව සඳහන් වේ.

**"තිස්සමහා විහාරය දැනට ජරාවාසව තිබෙන හෙයින් මෙම විහාරයට අයත් උස්බිම් හා පහත්බිම් ද තිසා වැව ද එම විහාරයෙහි මතුවට ප්‍රකෘතිමත් කරනු සඳහා"ය** (රාහුල, 1987:109)

එසේම කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1635-1687) දවස සරණංකර හිමි විසින් මෙහෙයවනු ලැබූ ගණින්නාන්සේලා විසින් විවිධ විහාර පිළිසකර කිරීම සඳහා වගකීම් භාරගෙන කටයුතු කළ බව සඳහන් වේ.

- **තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමි - රිදී විහාර ප්‍රතිසංස්කරණය**
- **ඉදිපාන්ගමුවේ සාමණේර - ශ්‍රී මහා බෝධි ප්‍රාකාරය බැඳවීම**
- **වටරක්ගොඩ ධම්මපාල - මූලගිරි විහාර ප්‍රතිසංස්කරණය**
- **මාපිටිගම බුද්ධරක්ඛිත - කැලණි විහාර ප්‍රතිසංස්කරණය**
- **ඇන්නෝරුවේ අත්ථදස්සි - නාක්කාවත්තේ පැරණි දාගැබ**

(මල්සිරි, 2011:191-192)

පෙර දැක් වූ ලෙස ශ්‍රී මහා බෝධියට ශිලාමය ප්‍රාකාරයක් ඉදිපාන්ගමුවේ සාමණේර විසින් සකස් කළ බව සඳහන් වන අතර ඒ සඳහා නුදුරින් වූ නටඹුන් වූ පැරණි ගොඩනැගිලිවලට අයත් ගල් කොටස් ගෙනවිත් එක උඩ එක තැබීමෙන් එය සිදු කළ බව සඳහන් වේ (රත්නායක, 2003:7). 17 වැනි හා 18 වැනි සියවස් තුළ දී උරුමය ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් හෝ වෙනයම් අරමුණු ඇතිව ශිල්පායතන ආරම්භ කළ බව 'මන්දාරම් පුර පුවතේ' සඳහන් වේ. එසේම ඒ සඳහා තනතුරක් ද ඇති කළ බව සඳහන් වේ. කෙසේ වෙතත් මෙම යුගය තුළ දී නෛතිකව උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ ක්‍රියාමාර්ග ගත් බව සන්නස් හා තුඩපත් තුළින් හඳුනාගත හැකි ය.

01. **උරුමය ජීවමාන කරවන අස්පර්ශිත උරුමය සඳහා ව්‍යවස්ථා පැනවීම - කුට්ටාපිටිය සන්නය**

02. **අක්‍රියව බැවති පැරණි සම්ප්‍රදායන්හි වලංගුතාව ඇති කිරීම - ගුණදාහේ පරපුරට දුන් සන්නය**

03. **නව ප්‍රදානයන් සිදු කර නෛතික ආරක්ෂාව ලබා දීම - දෙගල්දොරුව සන්නය**

04. **විහාර ප්‍රතිසංස්කරණය හා සංරක්ෂණ සඳහා නෛතික බලය ලබා දීම - වළල තුඩපත** (මල්සිරි, 2011:207)

මහනුවර රාජධානි සමයේ දී රාජාධිරාජසිංහ රජු (ක්‍රි. ව. 1581-1592) විසින් පනවන ලද නියෝගයකට අනුව විහාරාරාම ඉදිකිරීම හෝ අත්හැර දමන ලද ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කරන්නේ නම් භික්ෂූන් වහන්සේලා ඔවුන්ගේ ප්‍රධානීන් මාර්ගයෙන් රාජ්‍ය පාලකයා දැනුවත් කළ යුතු බව දක්වා ඇත (ගුණවර්ධන, 2005:51). මෙම යුගය වන විට දැව නිර්මාණ ඉදි වීම ද

විශාල වශයෙන් සිදු විය. ටැම්පිට විහාර නිර්මාණය, අම්බලම් ආදී නිර්මාණ මෙහි දී නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. වළල තුඩපතට අනුව දැවමය ස්මාරකයන්ගේ ආරක්ෂාව සඳහා යෙදන ලද ප්‍රතිකර්මයන් පිළිබඳ ව ද සඳහන් වේ.

**'මැදගල් වලවල් කොටවා ඒ වටේ වේයෝ නොයන හැටියට තෙල් පැන් වත්කොට තියෙන ලෙස ආදිශ්‍යයක් ද කෙටවීමෙනි'** (ධම්මානන්ද, 1969:203)

මෙම කරුණු තුළින් පැහැදිලි වන්නේ දහසය වැනි සියවසේ සිට විසි වැනි සියවස දක්වා මුල් යුගයේ උරුමයන් සම්බන්ධයෙන් දක්වා ඇති මැදිහත් වීමේ ස්වාභාවයයි. මෙම යුගය තුළ බුද්ධ ශාසනය ගැටලු ගණනාවකට මුහුණ දී ඇති බවත් මෙම නිසා උරුම කළමනාකරණ කටයුතු ඉතා මන්දගාමීව සිදු වූ බව හඳුනාගත හැකි ය.

ක්‍රිස්තු වර්ෂයෙන් 1815 මාර්තු දෙ වැනි දින උඩරට ගිවිසුම හරහා ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් රාජයත් වේ. මෙම ගිවිසුම මගින් ශ්‍රී ලාංකීය පාලකයින්, ප්‍රභූන් එක්ව බ්‍රිතාන්‍ය කිරීටය සමග සම්මුතියකට එළඹීම් මගින් මෙරට උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ විධි විධාන අනුමත කර ගත් බව දැකිය හැකි ය. එහි පස් වැනි වගන්තිය උරුමය ආරක්ෂාව උදෙසා යෙදූ ප්‍රතිපාදන හඳුනාගත හැකි ය.

**'බුද්ධ ශාසනය ද දේවාලගම ද කඩකළ නොහැකිව පවත්වන්ට ඕනෑවා සහ එකී කටයුතු ද සංඝයා ද, විහාරස්ථාන ද දේවාග ධ පවත්වන්ට සහ ආරක්ෂා කරන්නත් ඕනෑයැ'** (විමලානන්ද, 1983:65)

මින් පසුව බ්‍රිතාන්‍යන් විසින් මල්වතු හා අස්ගිරි විහාර සංඝයා අතර පවත්වන ලද සාකච්ඡාවල දී නැවත වරක් පැරණි උරුමය ආරක්ෂා කිරීමට ඔවුන් තුළ ඇති කැමැත්ත ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කරන ලදී (ගුණවර්ධන, 2005:66). එහෙත් මෙම පොරොන්දු 1818 දී ඇති වූ උඩරට කැරැල්ල හේතුවෙන් උල්ලංගනය වූ අතර පසුව දේශිය ජනයා දිගින් දිගටම මේ පිළිබඳ ව උද්ඝෝෂණ කිරීම හේතුවෙන් බ්‍රිතාන්‍යයන් නැවත ඒ පිළිබඳ ව සළකා බලන ලද බව හඳුනාගත හැකි ය.

1817 වර්ෂයේ දී  බ්‍රිතාන්‍ය ජාතික රැල්ෆ් බැක්හවුස් විසින් අනුරාධපුර, පොළොන්නරුව මින්නේරිය, කන්තලේ ආදී ප්‍රදේශවල සංචාරයක නිරත වී ඇති අතර පූරාණ උරුමයන් හා වැව් හා නටඹුන් හා ගොඩනැගිලිවල මිනුම් ලබාගැනීමට කටයුතු කර ඇත (එම, 67). 1829 දී බ්‍රිතාන්‍ය ජාතික කපිතාන් ෆාගන් පුරාණ උරුමයන්හී පැවති තත්කාලීන ස්වාභාවය පිළිබඳ ව ලංකා ගැසට් සඟරාවට තොරතුරු වාර්තා කිරීමක් ද සිදු කර ඇත. ජොනතන් ෆෝබ්ස් 1828 දී ශ්‍රි ලංකාවේ බොහෝ ස්ථානයන් හී සංචාරය කර පුරාවිද්‍යා උරුමයන්ගේ කාලීන වශයෙන් ශේෂව පැවති තත්ත්වයන් වාර්තා කළ බවත් ඒවායේ වටිනාකම් හා ඓතිහාසික කරුණු ඇතුලත් කරමින් කෘති සම්පාදනය

කරමින් ප්‍රකාශයට පත් කිරීම ද සිදු කර ඇත. ෆෝබ්ස් වාර්තා අනුව අභයගිරි ස්තූපය හෙළි පෙහෙළි කිරීම 1828-1829 යුගයේ දී මුල්වරට සිදුව ඇති අතර එක් ධෛර්ය සම්පන්න භික්ෂුවක් එම කාර්ය කළ බව දක්වා ඇති අතර එක් අවස්ථාවක ස්තූපයේ එක් කොණක වූ බදාම පතුරක් ගැලවී අඟ මත පතිත වීම නිසා බරපතල ලෙස තුවාල ලැබූ බව සඳහන් වේ (තෙන්නකෝන්, 2005:408-409). මෙය මුල් යුගයේ ජේතවනාරාමය වැරදි ලෙස හඳුනාගනිමින් සිදු කළ ලේඛනයක් වන අතර මෙය වත්මන් ජේතවනාරාමය ස්තූපය ආශ්‍රිත ව සිදු වූ ස්තූප නඩත්තුවක් ලෙස නිවැරදි විය යුතු වේ. 1831 වර්ෂයේ දී අනුරාධපුර ඉපලෝගම අනුනායක ස්වාමීන් වහන්සේ විසින් මහනුවර සංඝසභා මණ්ඩලය වෙත පුරාවිද්‍යා උරුමයන්ට සිදුව ඇති විනාශයන් පිළිබඳ ව වාර්තාවක් ඉදිරිපත් කරමින් ඒවා ප්‍රතිසංස්කරණය කළ යුතු බව දන්වන අතර පසුව අනුරාධපුරයේ බෞද්ධ උරුමයන් ආරක්ෂා කිරීම එම මණ්ඩලයේ වගකීමක් ලෙස සළකා මැදිහත් වූ බව ද සඳහන් වේ (ගුණවර්ධන, 2005,67-68). 1840 දශකයේ දී භික්ෂූන් වහන්සේ කෙනෙකු විසින් සම්මාදම් කර එකතු කළ විශාල මුදලක් වැය කර ශ්‍රීමත් හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරයාගේ යුගයේ දී ථූපාරාමය ද ප්‍රතිසංස්කරණය කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු කළ පුද්ගලයා දාගැබ් ගොඩනැන්වීම් කටයුතු පිළිබඳ කිසිවක් නොදත් සින්න ආදිකාර් නම් දෙමල ජාතිකයෙක් බව සඳහන් වේ (තෙන්නකෝන්, 2005:410). 1840 දී පවුම් හතළිහක මුදලක් පුරාවිද්‍යා ගොඩනැගිලි මතු කර ගැනීම සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව විසින් වෙන්කර ඇත (ගුණවර්ධන, 2005:68-69) මෙමගින් ඇති වූ නව ප්‍රබෝධය හේතු කර ගෙන ජස්ටින් ස්ටාර්ක් සභාපතීත්වයෙන් යුතු රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛාව පිහිටවනු ලැබූ අතර එමඟින් මෙරට පුරාවිද්‍යා උරුමයන් පිළිබඳ ව ආශාවන් දක්වන්ට මහඟු අවස්ථාවක් විය (එම). මේ වන විට අනුරාධපුර නගරය සම්පූර්ණයෙන්ම වල් වැදී පැවත ඇති අතර 1849 දී අනුරාධපුර කච්චේරියේ සැමුවෙල් ජයතිලක විසින් ථූපාරාමයේ වූ සඳකඩපහණක් ඇලගමුවට ගෙනගොස් ඇත (තෙන්නකෝන්, තෙන්නකෝන්, 2005:411). පසුව අනුනායක හිමිගේ පැමිණිල්ලක් අනුව ඔහුගේ වියදමින් නැවත එය රැගෙන විත් සවිකර ඇත.

1852 දී මෙරට ආණ්ඩුවේ සහකාර ඒජන්ත වූ ඒ.ඕ. බ්‍රෝඩි විසින් එංගලන්තයේ සිට මෙහි ගෙන්වා ගත් පාලාස්ටර් ඔෆ් පාරිස් බදාමය භාවිත කරමින් මෙරට කැටයම්වල අච්චු ලබා ගැනිමට උත්සහ කර ඇතත් එය සාර්ථක වී නොමැති බව අයිවර්ස් පවසයි (එම). 1853 වර්ෂයේ දී අනුරාධපුරයේ විශාල පිංකමක් පවත්වා ඇති අතර එහි දී රුවන්වැලි සෑය සුදු රෙදිවලින් සරසා එහි මුදුනට තඹ හෝ පිත්තල කොතක් පැළඳවා ඇත (එම). 1859 දී අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය, මිහින්තලේ, රිටිගල, අව්කන, දඹුල්ල, මාතලේ අළු විහාරය ආදී උරුම ස්ථානයන් පිළිබඳ වාර්තා කිරීම් සිදු කර ඇති අතර අනුරාධපුර හා පොළොන්නරු නගරයේ උරුම ස්ථාන කිහිපයක් හඳුනාගනිමින් ඒවා ඇතුලත් කර එමර්සන් ටෙනන්ට් විසින් නගර සැලසුම් සකස් කිරීම ද සිදු කර ඇත (ගුණවර්ධන, 2005:70). 1868 වර්ෂයේ දී යාපනේ ආණ්ඩුවේ ඒජන්ත වූ රසල් මහතා විසින් ඉන්දියාවේ උරුමය ආරක්ෂා කිරීම

සඳහා සාන්ත ජෝර්ජ් කොටුවේ ගැසට් පත්‍රයට සපයා ඇති නිල පත්‍රිකාව අනුව අනුරාධපුර හා පොළොන්නරුවේ ගෘහ නිර්මාණ නෂ්ඨාවශේෂ ආරක්ෂා කළ යුතු බව යෝජනා කර ඇත (තෙන්නකොන්, 2005:412).

1870 දශකයේ දී ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයා වූ එල්.සී. ලීසිංගේ විශේෂ උනන්දුව හා කැපවීම මත අනුරාධපුරයේ බොහෝ නටඹුන් සොයා ගන්නා ලදී. වැරදියට වටහා ගනිමින් ජේතවනාරාමය ලෙස එකී යුගයේ සලකන අභයගිරියේ වන චමත්කාර සඳකඩපහණ සොයාගන්නා ලද්දේ ද මොහුගේ උනන්දුව නිසාවෙනි. ලීසිං විසින් සොයාගන්නා ලද නටඹුන් ආණ්ඩුව වෙනුවෙන් ඡායාරූප ගතකරන ලද්දේ ලෝටන් විසිනි. 1874 දී කපිතාන් හොග් විසින් ඡායාරූප ගැනීම් කටයුතු ආණ්ඩුව වෙනුවෙන් සිදු කළ අතර මූර්ති හා කැටයම්වල අච්චු ලබාගැනීමට ඔහුට අවශ්‍යය අමුද්‍රව්‍ය රජය විසින් සපයා තිබේ. ඔහු විසින් පිටපත් කරන ලද සෙල් ලිපි පසුව ගොල්ඩ්ස්මිත් හා මුලර් විසින් පරීක්ෂා කර ඇති බව සඳහන් වේ (තෙන්නකොන්, 2005:412-413). 1878 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට සිදු ව ඇති හානිය පිළිබඳ ව වාර්තාවක් ග්‍රෙගරිවිසින් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. එය විද්‍යාත්මක වැඩ කොටසක් මෙහි දී සිදු කර ඇති අතර එය 'Discovery and Preservation of Ancient Monument'යන ලේඛනය තුළින් වාර්තා කර ඇත (ගුණවර්ධන, 2005:71). 1884-1885 වර්ෂවල දී පුරාවිද්‍යාත්මක ගවේෂණ ගණනාවක් බාරෝස් විසින් සිදු කර ඇති අතර ඒ පිළිබඳ වාර්තාවක් ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇත (තෙන්නකොන්, තෙන්නකොන්, 2005:435).

1890 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටු වීමත් (ගුණවර්ධන, 2005:78) එච්.සී.පී. බෙල් ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන් පත්කිරීමත් (කරුණාරත්න, 1990:4) සමග පැරණි ක්ෂේත්‍ර ආශ්‍රිත ව ගවේෂණ හා කැණීම් පර්යේෂණාත්මක ස්වරූපයෙන් ආරම්භ විය. ස්මාරක හා ගොඩනැගිලි ක්‍රමානුකූල වාර්තාගත කිරීමේ කටයුතු මෙම යුගයේ සිට ඇරඹුණි. බෙල් විසින් ඉතා වටිනා මිනින්දෝරු සිතියම් සම්පාදනය කිරීම මෙහි දී වඩා වැදගත් වේ (ගුණවර්ධන, 2005:78). බෙල්ගෙන් පසුව ඊ.ආර්. අයර්ටන් 1912-1913 දක්වා කොමසාරිස් ධුරයේ වැඩ කටයුතු කරමින් පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට කටයුතු කරයි. මෙම යුගය වන විට ප්‍රථම ලෝක සංග්‍රාමය ආරම්භ වීමත් ලෝකයේ බොහෝ රටවල් එයට සම්බන්ධ වීමත් නිසාවෙන් මෙම යුගයෙන් උරුමයන් සම්බන්ධයෙන් සිදු කරන ලද මැදිහත් වීම් අඩපණ වේ. 1922 වර්ෂයේ දී ආතර් මොරිස් හෝර්කාට් පුරාවිද්‍යා කොමසාරිස් ධුරයට පත් වීමත් සමග නැවත උරුමයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් ආරම්භ වීමට හේතු වේ. මෙම යුගයේ සිදු වූ විශේෂ සිදුවීම වූයේ කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමයි. ඒ අනුව හෝකාට් දක්වා ඇති පරිදි,

**'පුරාවිද්‍යා ස්ථාන කැණීම් කිරීමෙන් ඉක්බිතිව එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් සංරක්ෂණ කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවත් එබඳු දීර්ඝ වැඩ කටයුත්තකට**

කිසියම් හෝ වැඩපිළිවෙලක් නොමැති නම් කැණීම් කටයුතු සිදු නොකල යුතු යි' (ගුණවර්ධන, 2005:78) ලෙස දක්වා ඇත.

මෙම යුගයේ දී ශිලා ලේඛන පිළිබඳ විශේෂඥයකු වූ සෙනරත් පරණවිතාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එකතු වීම ද මෙරට පුරාවිද්‍යා ඉතිහාසයේ විශේෂිත අවස්ථාවකි. හෝකාට්ගෙන් පසුව කොමසාරිස් ධූරය සඳහා ඒ.එච්. ලෝංහර්ස්ට් මහතා පත්වන අතර ඉන්දීය පුරාවිද්‍යාව පිළිබඳ හසල දැනුමක් පැවති ඔහු පොළොන්නරුවේ හින්දු ආගමික උරුමයන්ගේ ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදි. මෙම යුගයේ දී බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාර හරහා උරුමය රැකගැනීම සඳහා කටයුතු කළ බව පෙනේ. බෙල්ගේ ඇතැම් ක්‍රියාවන් දැඩිලෙස හෙලා දකිමින් මෙම පුනර්ජීවන කණ්ඩායම් ඉංග්‍රිසි ආණ්ඩුවට බලපෑම් කළ බව පෙනේ. පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ව සිදු කරන ලද නවීකරණයන් පුරාවිද්‍යාත්මක උරුමයේ විනාශයට හේතුවන බව දක්වමින් දැඩි ලෙස විවේචනය කළහ. වලිසිංහ හරිස්චන්ද්‍ර, අනගාරික ධර්මපාල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි වැනි පිරිස් මෙහි දී ප්‍රමුඛව ක්‍රියා කරන ලදි (ගුණවර්ධන, 2005:80).

කෙසේ වෙතත් 1940 දී දේශීය මුලයකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ධූරය හිමි වේ. ඒ සෙනරත් පරණවිතාන ශූරීන්ට වේ. මේ හේතුව නිසා ගැටලු ගණනාවක් විසඳුණු අතර පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම, ආචාරධර්ම හා මූලධර්ම මූලික කර ගනිමින් සංරක්ෂණ කටයුතුවල නියලීම මෙම යුගයේ වැදගත් ලක්ෂණයන් වේ. එසේම පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව සඳහා 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥා පණතක් සම්මත කර ගැනීම ද වැදගත් කරුණක් වේ.

පුරාවිද්‍යා දෙපාර්තමේනතුව පිහිටු වීමෙන් අනතුරුව පුරාවිද්‍යාත්මක ස්මාරක සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් සිදු කරන ලද්දේ 1948 දශකයෙන් පසුවයි. මහාචාර්ය පරණවිතාණ විසින් ශිලා ලේඛනයන් පිළිබඳ ව පුළුල් ව සොයා බලන අතර ස්මාරකයන් අර්ථකතනය කිරීම ද එමඟින් සිදු කරන ලදි. මහා පරිමාණ ස්තූප ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොමු වීම ද මෙම යුගයේ හඳුනාගත හැකි ලක්ෂණයක් වේ.

1958 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ පුරාවිද්‍යාව හැදෑරීම සඳහා අවස්ථාව ලබා දෙන අතර පේරාදෙණිය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවලට ඒ සඳහා අවස්ථාව ලැබුණි. 1966 දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය බිහිවීමත්, පුරාවිද්‍යා කළමනාකරණ සංකල්පයේ ඉදිරි වර්ධනයට හේතු විය (එම, 227). 1960 දී අනුරාධපුර පැරණි නගරයේ ආරක්ෂාව සඳහා සංරක්ෂණ මණ්ඩලයක් පිහිටු වීම මෙම යුගයේ වැදගත් කාර්යයකි. මෙමඟින් පුරාවිද්‍යා කොමසාරිස් සතු බලතල කිහිපයක් ද අනුරාධපුර දිසාපතිට පවරා දෙන ලදි (ප්‍රනාන්දු, 1990:133). මෙයට අමතරව ස්මාරක පිළිබඳ ව විධිමත් නාමාවලියක් සකස් කිරීම ද මෙම යුගයේ දී සිදු විය (එම, 142). 1963 වර්ෂයේ දී පැරණි ගොඩනැගිලි තහවුරු කිරීමේ දී පුරාවිද්‍යාත්මක අගයන්ට හානි නොවන සේ තහවුරු කිරීම පිළිබඳ යොමුවක් ද

මෙම යුගයේ සිදු කරයි. 1960-1990 යුගයේ දී ස්ථිර වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටුවීමත් මෙරට පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් වූ කඩඉමකි (Wijesuriya, 1993:18). 1980 දශකය පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ඉතා වැදගත් යුගයක් වේ. පුරාවිද්‍යාවේ වර්ධනය සඳහා ප්‍රධාන ධාරාවන් දෙකක් මෙම යුගයේ බිහි වේ. එනම්,

01. **ශාස්ත්‍රීය හා විද්‍යාත්මක ධාරාව ඔස්සේ පර්යේෂණ මට්ටමෙන් ආරම්භ වූ සංස්කෘතික ත්‍රිකෝණය හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

02. **දේශපාලන ධාරාවන් ඔස්සේ ක්‍රියාත්මක වූ උදාගම් සංක්පය** (ගුණවර්ධන, 2005:81)

සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රමුඛ කර ගනිමින් අනුරාධපුර, අභයගිරිය, ජේතවනාරාමය, පොළොන්නරු ආලාහණ පිරිවෙන, සීගිරිය, දඹුල්ල හා මහනුවර ආදී ව්‍යාපෘති හයක් ආරම්භ කරමින් පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට මැදිහත් වේ. මෙම කරුණු පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් අවස්ථාවක් විය. 1990-1997 කාලයේ දී තිවංක පිළිමගෙය, දෙමළ මහා සෑය, රන්කොත් වෙහෙර සම්බන්ධ මැදිහත්වීම් ද මෙම යුගයේ කැපීපෙනේ. 1992 ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව බිහි කිරීමත් සමඟ පුරාවිද්‍යා කළමනාකරණ සංකල්පයේ ඉදිරි වර්ධනීය කටයුතු සඳහා ද හේතුවක් විය.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි පීඨය මඟින් 1990 දී සීගිරිය හා දඹුල්ල ප්‍රදේශයේ පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා ආරම්භ කළ ජනාවාස පුරාවිද්‍යා, ක්ෂේත්‍ර පුරාවිද්‍යා කටයුතු, 1995 වර්ෂයේ දී තිස්සමහාරාම ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ නාගරික පුරාවිද්‍යා කටයුතු මෙරට උරුමය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සිදු කළ කැපීපෙනෙන කටයුතු වේ (ගුණවර්ධන, 2005:81). සංස්කෘතික ත්‍රිකෝණය මගින් මුල් කාලීන උරුම කළමනාකරණ කටයුතු සඳහා දැක් වූ දායකත්වය පහත පරිදි දැක්විය හැකි ය.

1990 දශකයෙන් පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙරට ප්‍රාග් ඓතිහාසික උරුමය පිළිබඳ හඳුනාගැනීම වාර්තාගතකරණය හා ඉදිරිපත් කිරීම සඳහා විශාල පියවරක් ආචාර්ය සිරාන් දැරණියගලගේ ප්‍රධානත්වයෙන් සිදු කරයි. එසේම මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ද තවදුරටත් මෙරට උරුමයේ කළමනාකරණය පිළිබඳ වැඩසටහන් දියත්කරනු ලැබීය. 1982 වර්ෂයේ ආරම්භ කළ ජේතවනාරාම ස්තූපයේ සංරක්ෂණ කටයුතු අවසන් කිරීම, අභයගිරි ස්ථූපයේ සංරක්ෂණ කටයුතු අවසන් කිරීම හා ප්‍රදේශීය වශයෙන් ව්‍යාපෘති (වයඹ චතුරස්‍රය, ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය, මොණරාගල ව්‍යාපෘතිය, බදුල්ල ව්‍යාපෘතිය) ඇති කරමින් උරාවිද්‍යා උරුමය හඳුනා ගැනීමත් මැදිහත් වීම් සිදු කිරීමට යොමු වීමත් මෙහි දී විශේෂයෙන් දැක්විය හැකි වේ. ඒ අනුව වර්තමානය වන විට නෛතික ව්‍යුහයන්ගේ ආරක්ෂණය සඳහා පොලිස් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, නගර හා ග්‍රාම නිර්මාණ

දෙපාර්තමේන්තුව මෙන්ම මහාමාර්ග දේපාර්තමේන්තුව වැනි ආයතන සමග ද සහයෝගය ඇති ව කළමනාකරණ කටයුතු ව්‍යාප්ත කරනු දැකගත හැකි වේ.

## සමාලෝචනය

මෙරට උරුමයේ කළමනාකරණ ස්වරූපය හඳුනාගැනීමේ දී මූලික වශයෙන් බෞද්ධ දේශනා තුළ සඳහන් නියාමන ඉතා වැදගත් වේ. එයට ප්‍රධාන හේතුවක් වන්නේ මෙරට සංස්කෘතික නිර්මාණයක් සකස් වීම සඳහා බුදු දහමේ ආභාසය ලැබීමයි. ඒ අනුව ක්‍රි.පූ. 3 වැනි සියවසෙන් පසුව නිර්මාණය වන බෞද්ධ සංඝාරාම ආශ්‍රිත නිර්මාණ කළමනාකරණයේ දී මෙම උපදේශයන් යොදාගෙන ඇත. පසුකාලීනව සිදුවන විදේශීය ආක්‍රමණ නිසාවෙන් රජරට ශිෂ්ටාචාරය අත්හැර දමන අතර නැවත ඒ පිළිබඳ ව සොයා බැලීම යටත් විජිත යුගය තුළ දී සිදු කර ඇති අතර උරුම කළමනාකරණය සඳහා සිදුකළ මැදිහත්වීම් ද හඳුනාගත හැකිය. 1890 යුගය එහි ක්‍රියාකාරී අවධියක් බව පුරාවිද්‍යා පාලන වාර්තා අධ්‍යයනයෙන් හමුවේ. කෙසේ වෙතත් 1940 දශකයේ දී මෙරට උරුම කළමනාකරණය සඳහා විධිමත් නෛතික පසුබිමක් සකස් වීම ද 1980 දශකයේ උරුම කළමනාකරණ ආයතන පද්ධතීන් බිහිවීමත් තුළ උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ යෝජනාවලීන් හා ව්‍යාපෘති සකස් වූ බව හඳුනාගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංශය (ප්‍රථම භාගය),* (1996), ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

*චුල්ලවග්ග පාලි (02 කාණ්ඩය),* (2005), ආනන්ද මෛත්‍රෙය, බී. ජනානන්ද, යූ. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*පූජාවලිය,* (1997), ඤාණවිමල, කේ. (සංස්:), ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*රාජාවලිය,* (1997), සුරවීර, ඒ.වී. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
අබේසිංහ, ටී. (1969), *පෘතුගීසීන් හා ලංකාව,* ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්,කොළඹ.

කරුණාරත්න, එස්. (2000), *ශිලාලේඛ සංග්‍රහය (මිහින්තලේ සිව්වන මිහිඳුගේ පුවරු ලිපි දෙක),* පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

කරුණාරත්න, ඩබ්.එස්. (1990), *ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ ඉතිහාසය 1890-1910,* රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ගුණවර්ධන, පී. (2005), ***පුරාවිද්‍යා උරුමය ආකෘති, සංකල්ප සහ කළමනාකරණය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ, රාජගිරිය.

ප්‍රේමතිලක, එල්. ආනන්ද, කොළඹගේ. (2000), ***දළදා මාළිගාව නව සොයාගැනීම්, පැරණි බිතුසිතුවම්***, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

ප්‍රනාන්දු, ඩබ්.එම්, (1990), ***ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ ඉතිහාසය***, රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව.

මල්සිරි, ඩබ්.අයි. (2011), ***ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යා උරුම සංරක්ෂණයේ ඓතිහාසික විකාශය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

තෙන්නකෝන්, එම්.යූ.ඒ. තෙන්නකෝන්, වී. (2005), ***එදා වැව් බැඳි රාජ්‍යේ හෙවත් ලංකා සිවිල් සේවයේ ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ උතුරු මැද පළාතේ අත්පොත 1899***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

ධම්මානන්ද, එන්. (1969), ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

පරණවිතාන, එස්. (2001), ***පුරාවිද්‍ය පර්යේෂණ***, විහිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

වත්තල, එස්. (1998), ***අනුරාධපුර විහාරාරාම***, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.
විමලරත්න, කේ.ඩී.ජී. (1993), ***ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය***, රත්න ප්‍රකාශකයෝ, කොළඹ.

විමලානන්ද, ටී. (1983), ***උඩරට මහ කැරැල්ල***, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

රාහුල, අත්තුඩුවාවේ, (1987), ***තිස්සමහාරාමය***,වැල්ලම්පිටිය.

රත්නායක, එච්. (2003), ***ජේතවන ව්‍යාපෘතිය පුරාවිද්‍යා කැණීම් පිළිබඳව ප්‍රගති වාර්තාව (1983 ජූලි-දෙසැම්බර්)***, මධ්‍යම සංස්කෘතික අරමුදල කොළඹ.

United Nations Educational, Scientific and Cultural Organisation, (1972), ***Convention Concerning the Protection of the World Cultural and Natural Heritage***, Adopted by the General Conference at its seventeenth session Paris.

Wijesuriya, G. (1990), ***Archaeologyical heritage Management Suppliment (ICOMOS)***, Centrl Cultural Fund, Sri Lanka.